පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.12.10 පැය 0545 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2794/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට තැත් කර බරපතල තුවාල සිදුකිරීම සම්බන්ධව සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - හෝමාගම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.12.03 වන දින කොස්ගම පොලිස් වසමේ බොරවගොඩ ප්‍රදේශයේදී ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනයට තැත් කිරීම සම්බන්ධයෙන් හෝමාගම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මඟින් විමර්ශන ආරම්භ කර තිබුණි.

විමර්ශන නිලධාරින්ට ලද තොරතුරකට අනුව මෙම අපරාධය සිදු කළ වෙඩික්කරු, යතුරු පැදියේ පැදිකරු හා සැකකරුවන්ට නවාතැන් ලබා දෙමින් අපරාධයට ආධාර අනුබල දුන් සැකකාරියක් 2025.12.09 වන දින තුම්මෝදර ප්‍රදේශයේදී එම කොට්ඨාසයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 31 හා 45 වයස්වල පසුවන රුවන්වැල්ල සහ තුම්මෝදර ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර සැකකාරිය වයස අවුරුදු 43ක් වන තුම්මෝදර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

සැකකරුවන් විසින් අපරාධය සඳහා යොදාගත් රිවෝල්වර් අවියක්, ජංගම දුරකථනයක් පොලිසිය විසින් ඔවුන්ගේ ප්‍රකාශ මත සොයාගෙන ඇත. හෝමාගම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. නීති විරෝධී ලෙස මුහුදු මාර්ගයෙන් මෙරටට ගෙන්වන ලද බීඩි කොළ සහ පළිබෝධ නාශක තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වෙන්නප්පුව පොලිස් ස්ථානය**

රාජ්‍ය බුද්ධි අංශයේ නිලධාරීන්ගෙන් ලද තොරතුරක් මත 2025.12.09 වන දින උදෑසන කාලයේ වෙන්නප්පුව පොලිස් වසමේ මා ඔය, පරණ පාර ප්‍රදේශයේදී වෙන්නප්පුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මුහුදු මාර්ගය ඔස්සේ මෙරටට රැගෙන එන ලද බීඩි කොළ කිලෝග්‍රෑම් 626 අඩංගු පාර්සල් 17ක්, පළිබෝධ නාශක බවට සැක කෙරෙන පැකට් 60000 ක් අඩංගු පාර්සල් 20 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 27 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වෙන්නප්පුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දුරකථන සම්ප්‍රේෂණ කුළුණුවල සවිකර ඇති කේබල් සොරකමක් සම්බන්ධව සැකකරුවෙකු අත්අඩංගුවට - රඹුක්කන පොලිස් වසම.

රඹුක්න පොලිස් වසමේ යටගම, තල්හේන්කන්ද ප්‍රදේශයේ පිහිටි දුරකථන සම්ප්‍රේෂණ කුළුණක සවිකර තිබූ කේබල් සොරකමක් සම්බන්ධව රඹුක්කන පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කරන ලදී.

ඒ අනුව 2025.12.09 වන දින රඹුක්න පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සිද්ධියට සම්බන්ධ සැකකරුවෙකු සොරකම් කරන ලද තඹ කම්බි කිලෝ 13 කට අධික ප්‍රමාණයක් ද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන රඹුක්කන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රඹුක්කන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. හදිසි අනතුරකින් පුද්ගලයකු මියයාමක් - කටාන පොලිස් වසම.

2025.12.09 වන දින සවස් කාලයේ කටාන පොලිස් වසමේ කිඹුලාපිටිය ප්‍රදේශයේ ගිනි කෙළි නිෂ්පාදන ආයතනයක ඇතිවූ හදිසි පිපිරීමකින් බරපතල තුවාල ලැබූ පුද්ගලයෙකු මීගමුව රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇති බවට කටාන පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මියගිය පුද්ගලයා වයස අවුරුදු 20 ක් වූ බණ්ඩාරවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම පුද්ගලයා ඉහත ගිනිකෙළි නිෂ්පාදන ආයතයේ සේවකයෙකු ලෙස කටයුතු කර ඇති අතර එහි එළිමහන් මඩුවක් තුලදී මෙම පිපිරීම සිදුවී ඇති බවට මෙතෙක් සිදුකල විමර්ශන වලදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධිය සම්බන්ධව කටාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - මධ්‍යම කඳවුර පොලිස් වසම.

2025.12.09 වන දින උදෑසන කාලයේ මධ්‍යම කඳවුර පොලිස් වසමේ උහන මධ්‍යම කඳවුර මාර්ගයේ කිලෝමීටර් 08 කණුව ආසන්නයේදී උහන දෙස සිට මධ්‍යම කඳවුර දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන මාර්ගයට සමාන්තරව ගලා බසින වාරි ඇළකට පෙරළීමෙන් අනතුරක් සිදුව ඇති අතර යතුරුපැදිකරු එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වූ සියඹලාවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අම්පාර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මධ්‍යම කඳවුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - මාවනැල්ල පොලිස් වසම.**

2025.12.09 වන දින රාත්‍රී කාලයේ මාවනැල්ල පොලිස් වසමේ කොළඹ මහනුවර මාර්ගයේ හින්දෙණිය හන්දියේදී කෑගල්ල දෙස සිට මාවනැල්ල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් විරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රී රෝද රථ රියදුරු මාවනැල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 70 ක් වූ පිළිමතලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාවනැල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මාවනැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**